## <u>ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම - 2026</u>

### <u>හැඳින්වීම</u>

දිවයින පුරා විසිර සිටින ශ්‍රවණ සහ අක්ෂි ආබාධ සහිත ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ කායික , මානසික සෞඛ්‍ය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් ගෞරවනීය සහ ආත්මඅභිමානායෙන් යුතු සෞඛ්‍ය සම්පන්න වැඩිහිටි පිරිසක් අරමුණු කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව ශ්‍රවණ උපකරණ සහ ඇස් කණ්නාඩි ආධාරක උපකරණ ලබා දීමට කටයුතු කරනු ලැබේ. මෙම වැඩසටහන “ පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ” රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි “ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් විශ්‍රාම ජීවිතයක්” යටතේ සහ ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ 6.2 වගන්තියේ සෞඛ්‍ය හා යහපැවැත්ම යටතේ සෞඛ්‍ය සම්පන්න වියපත් වීම යටතේ ක්‍රියාත්මක කෙරේ. මෙම වර්ෂයේදී දිවයින පුරා ශ්‍රවණ උපකරණ 700 සහ ඇස් කණ්නාඩි 850 ක ප්‍රමාණයක් ලබාදීමට සැලසුම් කර ඇත.

### <u>අරමුණු -</u>

- වැඩිහිටියන් හට අභිමානයෙන් යුත් ජීවන තත්ත්වයක් ලබා දීම.
- ශ්‍රව්‍ය හා දෘශ්‍ය දුර්වලතා නිසා සමාජයෙන් වෙන් වී සිටින වැඩිහිටියාට පෙනීම ලබා දීම තුළින් සමාජයට අනුගත වී තෘප්තිමත් මනා පෞරුෂයකින් යුක්තව සැදෑ සමයක් ගත කිරීමට හැකියාව සැලසීම.
- රටේ ආර්ථිකයට දායකත්වයක් ලබාදිය හැකි පුරවැසියෙකු බිහි කිරීම.
- සමාජයෙන් හුදෙකලා වී සිටින වැඩිහිටියා සමාජගත කිරීම.

### <u>ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>

- ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පුරා විසිරී සිටින අක්ෂි ආබාධ සහිත සහ ශ්‍රවණ ආබාධ සහිත වයස අවුරුදු 60 ඉක්මවූ සහ අඩුආදායම්ලාභී වැඩිහිටියන් හා වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

- 2026 වර්ෂයට අදාළ අයදුම්පත් මගින් වැඩිහිටියාගේ තොරතුරු නිවැරදිව ලබා ගත යුතුය.

- ශ්‍රවණ උපකරණ ඉල්ලීම් කරනු ලබන සෑම අයදුම්කරුවකු විසින්ම ශ්‍රවණ උපකරණ පැලදීමේ අවශ්‍යතා ඇති අයෙකු බවට අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි වෛද්‍යවරයෙකු / ශ්‍රවණවේදියෙකු නිර්දේශය ලබා ගැනීම කළ යුතු අතර, ප්‍රතිලාභියාගේ කන සම්බන්ධව ලබා ගන්නා වාර්තාව (AUDIOMETRY ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

- ඇස් කණ්නාඩි, ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් විසින් ඇස් කණ්නාඩි (BIFOCAL) පැලදීමේ අවශ්‍යතා ඇති අයෙකු බවට අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි වෛද්‍යවරයෙකු / අක්ෂි තාක්ෂණවේදියෙකු නිර්දේශය ලබා ගැනීම කළ යුතුය.

- අදාළ අයදුම්කරු සුදුස්සෙකු බවට අයදුම්පත්‍රයෙහි ග්‍රාම නිලධාරි හා වැඩිහිටි විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර තිබිය යුතුය.

- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පුමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිලාභීන්ගේ ලේඛනයක්ද සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අධ්‍යක්ෂගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. ( ඇමුණුම 01 මඟින් දක්වා ඇත. )

- අයදුම්පත් එවීමේදී 2026.06.30 දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

- ශ්‍රවණ උපකරණ / ඇස් කණ්නාඩි සකස් කිරීමෙන් පසුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දීමට කටයුතු කෙරේ.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල /දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමුකරන ලද ශ්‍රවණ උපකරණ /ඇස් කණ්නාඩි විධිමත්ව භාර ගැනීම හා අදාළ ප්‍රතිලාභියාට නිසි පරිදි නිකුත් කිරීම සඳහා විධායක / මාණ්ඩලික නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතු අවම වශයෙන් නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. එම උපකරණ කාර්යාලය වෙත ලද පසුව අදාළ කමිටුව විසින් විධිමත්ව භාරගෙන අදාළ ප්‍රතිලාභියා වෙත නිසි පරිදි නිකුත් කළ යුතු අතර, ඒ පිළිබඳව ආධාර උපකරණ බෙදා හැරීමේ ලේඛණයේ කමිටු නිලධාරින් අත්සන් කර නම සහ තනතුර සඳහන් කළ යුතුය. එසේම ප්‍රතිලාභියා වෙත ලබා දුන් බවට වන අත්සන් සහිත ලේඛනයද ලබා ගත යුතය. ( ඇමුණුම 02 මඟින් බෙදා හැරීමේ ලේඛනය සහ අත්සන් ලේඛනයේ ආකෘතිය දක්වා ඇත )

- එම ලබාගත් කමිටු වාර්තාව සහ අත්සන් ලේඛනය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට එවිය යුතුය.

**<u>අධීක්ෂණය හා පසුවිපරම</u>**

- ශ්‍රවණ උපකරණ / ඇස් කණ්නාඩි ලබාදීමෙන් පසුව එම උපකරණ සම්බන්ධයෙන් සිදුවන අළුත්වැඩියා /ගැටළු හා අනෙකුත් අවශ්‍යතා සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරියා විසින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හෝ උපකරණ ලබා දෙන ආයතනය සම්බන්ධීකරණය කළ යුතුය.